# ලංකා රසායන විද්‍යා ආයතනය
## රසායන විද්‍යා විද්‍යාලය

## කාර්යාල කාර්යය සහයක

අංක 341/22, කෝට්ටේ පාර, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයේ පිහිටා ඇති ලංකා රසායන විද්‍යා ආයතනයේ කාර්යාල කාර්යය සහයක තනතුරක් සඳහා පහත දක්වා ඇති සුදුසුකම් සහ හැකියාවන් ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

රාජගිරිය සහ අවට ප්‍රදේශ වල පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇත.

**සුදුසුකම් හා හැකියාවන්:**

1. අ.පො.ස සාමාන්‍යය පෙළ අවම වශයෙන් විෂයයන් 6 කින් සමත් වීම. අ.පො.ස උසස් පෙළ සඳහා පෙනී සිටීම විශේෂ සුදුසුකමක් වනු ඇත.
2. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සාමාන්‍ය දැනුම හා පරිගණක භාවිතය පිළිබඳ මූලික දැනුම.
3. සති අන්තයේ හා නිවාඩු දිනයන්හිදී සේවය කල හැකි වීම. (ඒ වෙනුවෙන් වෙනත් දිනයන්හිදී නිවාඩු ලබාගත හැකිය.)
4. වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

පහත සඳහන් රාජකාරි වල නිරත වීමට සිදුවේ.

1. අදාළ නිලධාරීන්ගේ උපදෙස් මත දේශන ශාලා ඇතුළු කාර්යාල නිසි වේලාවට විවෘත කිරීම සහ නිසි පරිදි වසා දැමීම.
2. ලිපි ලේඛණ ඡායා පිටපත් / අනුපිටපත් (ඩුප්ලිකේටින් ) ගැනීම.
3. දේශන ශාලා වල පරිගණක උපාංග සකස් කිරීමට සහාය දීම.
4. අදාළ නිලධාරීන්ගේ උපදෙස් පරිදි ලිපි ලේඛණ බෙදාහැරීම, තැපැල්, බැංකු කටයුතු හා අවශ්‍ය බඩු මිලදී ගැනීම් සඳහා නිරතවීම.
5. නිලධාරීන්ගේ උපදෙස් මත කාර්යාලයේ සියලු අංශ වල කටයුතු සඳහා අවශ්‍ය සහය ලබා දීම
6. ආයතනයේ විශේෂ අවස්ථාවන්හි (උපාධි ප්‍රදානෝත්සවය, වාර්ෂික සැසිය වැනි) සහ ඊට අදාළ කටයුතු සඳහා උපකාරිවීම.
7. සභාපති/පීඨාධිපතිතුමිය/ලේඛකාධිකාරී හෝ ඔහුගේ බලයලත් නිලධාරියකු විසින් නියම කරනු ලබන වෙනත් රාජකාරි.

* සියලු ගෙවීම් සහිතව මාසික වැටුප රු **40,000/=** කට නොඅඩු මුදලක් උපයා ගැනීමට අවස්ථාව ඇත.

මෙම තනතුර සඳහා සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ හිමි වනු ඇත.

ඉහත සඳහන් සුදුසුකම් සහ හැකියාවන් ඇති මේ සඳහා උනන්දුවක් දක්වන්නන් තමන් පිළිබඳව නිර්දේශ ලබා දිය හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සඳහන් කළ ඉල්ලුම්පත මෙම දැන්වීමේ සඳහන් තනතුරේ නම ඉහළ වම් කෙළවරේ ලියන ලද ලියුම් කවරයක බහා පහත ලිපිනය වෙත හෝ විද්‍යුත් තැපෑලෙන් (vacancy@ichemc.edu.lk) 2023 ඔක්තෝම්බර් 5 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවීමට කටයුතු කරන මෙන් මෙයින් දන්වනු ලැබේ.

ලේඛකාධිකාරී,
ලංකා රසායන විද්‍යා ආයතනය,
341/22, කෝට්ටේ පාර,
වැලිකඩ,
රාජගිරිය.